*Sri Lanka Library Review, Volume 34, Issue 2, June 2020*

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ ඇගයීමක් (2017 වර්ෂයේ පැවැත්වූ පුහුණු වැඩසටහන් ඇසුරිනි)

# An evaluation of training programmes conducted by National Library and Documentation Services Board. (With special reference to programmes conducted in 2017)

**සෞම්‍යා සජීවනී වීරසිංහ**[1]

**Saumya Sanjiwani Weerasinghe**[1]

## Abstract

Significant functions of the National Library are conducting library related activities, educating national library personnel, offering training facilities for library professionals. This study was carried out to evaluate the training programmes conducted by National Library and 111 training programmes conducted in 2017 were selected for this purpose. Case study method was used for this research. Training programmes were analysed according to target group, contents, geographical location and duration of training programme sessions. Primary sources, observation and interviews were used to collect data for the study.

**Keywords**: Training programmes, Training methods, National Library

[1]තොරතුරු සහකාර, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කොළඹ

*email: saumyasw@gmail.com*

## සාරාංශය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ කාර්යයන් අතර එක් වැදගත් කාර්යයක් වනුයේ පුස්තකාල විද්‍යා වැඩසටහන් පවත්වා ගෙන යාම,ජාතික පුස්තකාල කාර්ය මණ්ඩලය මෙන්ම පුස්තකාල විද්‍යා වෘත්තිය පුහුණු පහසුකම් සැලසීමයි. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ ඇගයීමක් සිදු කිරීම සඳහා අරමුණු හතක් ඔස්සේ මෙහිදී අධ්‍යයනය සිදු කරන ලදි. මෙහිදී යොදාගත්තේ 2017 වර්ෂයේ සිදු කරන ලද පුහුණු වැඩසටහන් 111 කි. මෙම පර්යේෂණය සඳහා යොදා ගෙන ඇත්තේ සිද්ධි අධ්‍යයන ක්‍රමයයි.

මෙහිදී ඉලක්ක කණ්ඩායම,අන්තර්ගතය,භූගෝලීය පිහිටීම, පුහුණු වැඩසටහන් කාල සීමාව, අංශ හා පුහුණු ක්‍රමවේදය අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කරන ලදී. ප්‍රාථමික මූලාශ්‍ර නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා දත්ත රැස් කිරීමේ උපකරණ ලෙස යොදා ගන්නා ලද අතර දත්ත විග්‍රහය වඩාත් පැහැදිලි කිරීම සඳහා වගු සහ ප්‍රස්තාර උපයෝගීකොට ගෙන ඇත.


මූලික පද **: පුහුණු වැඩසටහන්, පුහුණු ක්‍රම, ජාතික පුස්තකාලය**

## හැඳින්වීම

මිනිස් ජීවිතයේ සාර්ථකත්වය බොහෝ දුරට අධ්‍යාපනය මත රඳා පවතී. අධ්‍යාපනය පුස්තකාලය හා බැඳී පවතින අතර දිනෙන් දින ලොව එකතුවන අති විශාල දැනුම් සම්භාරය අනාගත පරපුරෙහි අභිවෘද්ධිය සඳහා ප්‍රයෝජනවත් වෙයි. පුස්තකාලය, සෑම රටකම ඥාන කෝෂ්ඨාගාරයක් ලෙස සමාජයට ඉටු කරනු ලබන සේවාව අතිමහත්ය. මේ අනුව ලෝකයේ සෑම රටකම විවිධ වර්ගවලට අයත් පුස්තකාල ඇති අතර පාඨක ප්‍රජාවට එයින් සිදුවන සේවාව අති විශාලය. මෙම වර්ගීකරණය අතුරින් ජාතික පුස්තකාලයට සෑම විටම හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ජාතික පුස්තකාලය යනු රටක සංවර්ධනය උදෙසා තොරතුරු හා දැනුම් සමාජය වෙත බෙදාහරිනු ලබන ප්‍රධාන මධ්‍යස්ථානයයි. තම රටේ ඉතිහාසය, මතකය, සංස්කෘතිය සහ අනෙකුත් විවිධ තොරතුරු විශාල ප්‍රමාණයක් එක්රැස් කොට මැනවින් සංවිධානය කොට අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කොට පවත්වාගෙන යනු ලබන ප්‍රධාන ආයතනය ජාතික පුස්තකාලය වේ.

වර්තමානයේ අප ජීවත් වන්නේ තොරතුරු හා දැනුම පෙරදැරිකරගත් සමාජයක් තුළය. තොරතුරු තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුවත් සමඟ අද වන විට පුස්තකාලයේ භූමිකාවද පරිවර්තනයට ලක් වෙමින් පවතී. මෙම පසුබිම තුළ පුස්තකාල ක්‍රමයෙන් සම්ප්‍රදායික පුස්තකාලවලින් ඈත්ව තොරතුරු මධ්‍යස්ථාන බවට පත්වෙමින්

ඉලෙක්ට්‍රොනික පුස්තකාල, අතථ්‍ය පුස්තකාල බවට පරිවර්තනය වෙමින් පවතී. මෙම තාක්ෂණික දියුණුවත් සමඟ පුස්තකාලවලින් කෙරෙන එක් කාර්යයක් වන පුහුණු වැඩසටහන් පැවැත්වීම දැක්විය හැකිය.

අධ්‍යාපනය හා පුහුණුව සෑම වෘත්තියකම පැවැත්ම හා වර්ධනය සඳහා බලපාන වැදගත් මෙන්ම අනිවාර්යය සාධකයක් ලෙස හඳුනාගත හැකිය. කිසියම් කාර්යයක නියැලී සිටින්නා වූ පිරිසගේ කාර්යභාරය වැඩිදියුණු අධ්‍යාපන ක්‍රමයක් ලෙස "පුහුණුව" හඳුනාගත හැකිය. යම්කිසි විෂය ක්ෂේත්‍රයකට අධ්‍යාපන හා පුහුණු ආයතන ක්‍රියාත්මක කිරීම තුළින් වෘත්තිකයන්ට සිය වෘත්තිමය ජීවිතය පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රායෝගික හා න්‍යායික ඥානය ලබා දෙයි. වෘත්තීමය වශයෙන් ගත් කළ තීරණාත්මක බලපෑමක් ඇති කිරීමට හැකි සාධක දෙකකි, අධ්‍යාපනය හා පුහුණුව.

ඉතා ඉහළ වර්ධනයක් ඇති ආයතනවල තරඟකාරී වාසි වැඩි දියුණු කර ගැනීමට ඉතා උසස් මට්ටමේ පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම වැඩි වෙමින් පවති. වර්තමානයේ කාර්ය මණ්ඩලය සේවකයින් පමණක් ලෙස නොසලකයි. ඔවුන් හට සංවර්ධන අවස්ථා ලබාදී පාරිභෝගිකයින්ට වෙනස් වන අවශ්‍යතා සපුරාලීම සඳහා සේවා සැපයීම නිසා ඔවුන් ආයතනයේ ඉතා වටිනා පුද්ගලයන් ලෙස සලකයි. ආයතනවල කාර්යය මණ්ඩල මගින් ආයතනයේ ඉලක්ක කරා ළඟාවීමට උපකාරි කිරීමේ මූලික ක්‍රමවේදයක් ලෙස පුහුණුව සැලකේ.

ජාතික පුස්තකාලය දිනපතා නව අභියෝගවලට මුහුණ දෙයි. උදාහරණයක් ලෙස එකතු සංවර්ධන ක්‍රියාවලිය ජාතික පුස්කාලය තුළ වර්තමානයේ දැනුමේ දොරටු විවර කිරීමේ ක්‍රියාවලිය ඉෂ්ට කරයි. පාඨකයින්ට නිවැරදිව තොරතුරු ගවේෂණය කිරීම සඳහා නව සූචිකරණ ක්‍රමවේද එනම් මෙම දත්ත සම්බන්ධ කිරීම මගින් සිදු කරනු ලබයි. ජනප්‍රිය අන්තර්ජාල හා ලෝක ව්‍යාප්ත ජාලය (www) ඉතා ජනප්‍රිය වූවද මුද්‍රිත ද්‍රව්‍ය භාවිතයට වඩා ඉලෙක්ට්‍රෝනික මූලාශ්‍ර භාවිත කිරීමේදී පාඨකයින් හට විශේෂ වූ උපදේශකත්වයක් ලබා දිය යුතුය.

වර්තමානය වන විට කාලීන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි විවිධ වෘත්තිකයන්ට සම්බන්ධ ආයතන මගින් අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන්නේ ගුණාත්මක වෘත්තිය පරපුරක් බිහි කිරීමේ අභිලාෂයෙනි.

ශ්‍රී ලංකාවේ පුස්තකාල වෘත්තිය ආරම්භ වන්නේ විසිවන සියවසේ මැද භාගයේ දී ය. පුස්තකාල වැඩසටහන් විමර්ශනය කිරීමේ දී පෙනී ගිය කරුණක් වූයේ කෙටි කාලීන පාඨමාලා ප්‍රථමයෙන් ආරම්භ කර පසුව එය පශ්චාත් උපාධිය දක්වා වර්ධනය වූ ආකාරයයි. ඇතැම් පාඨමාලා විවිධ දුෂ්කරතා නිසා නවතා දැමීමට සිදු වූ අතර ඇතැම් පාඨමාලා වර්තමානයේ ද පවත්වන ආකාරය දැක ගත හැකිය. මේ

වන විට ජාතික පුස්තකාලය, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, කැලණිය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය හා ජාතික අධ්‍යාපන ආයතනය පුස්තකාල විද්‍යා පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. සාම්ප්‍රදායික ක්‍රමවලින් බැහැර වූ කාලීන යුගයේ අවශ්‍යතාවන්ට සරිලන ආකාරයට පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. ඒ තුළින් පුහුණු වැඩසටහන්වල ඵලදායීතාව ඉහළ නැංවීමට අවකාශය ලැබේ.

## පර්යේෂණ ගැටලුව

තම රටේ ඉතිහාසය, මතකය, සංස්කෘතිය සහ අනෙකුත් විවිධ තොරතුරු විශාල ප්‍රමාණයක් රැස්කොට මැනවින් සංවිධානය කොට අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂාකොට පවත්වාගෙන යනු ලබන ප්‍රධාන ආයතනය ජාතික පුස්තකාලය වේ. 1970 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මගින් 1970 වසරේ දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ස්ථාපිත කෙරිණ. එම මණ්ඩලයේ මූලික වගකීමක් වූයේ ශ්‍රී ලංකාව සඳහා ජාතික පුස්තකාලයක් ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම මෙන්ම ජාතික වශයෙන් ශ්‍රී ලංකාවේ ඇති සියලුම පුස්තකාල සේවාවන් සම්බන්ධීකරණය හා සංවර්ධනය කරලීම, ජාතියේ සංවර්ධනයට අවශ්‍ය තොරතුරු හා විඥාපන සේවා පවත්වාගෙන යාමය. එහි ප්‍රතිඵලයක් ලෙස 1990 අප්‍රේල් 27 වැනි දින ජාතික පුස්තකාලය ආරම්භ කරන ලදී.

ජාතික පුස්තකාලයට පැවරෙන කාර්යයන් පිළිබඳව කේ. ඩබ්ලිව්. හම්ප්‍රිස් (1966), මොරිස් ලයින් (1980), මහාචාර්ය මොහොමඩ් අල් නහරි (1984) ආදී විද්වතුන් විසින් විවිධ විග්‍රහයන් ඉදිරිපත් කොට ඇත. (අමරසිරි, 1990) ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රධාන කාර්යයන් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත හා අප්‍රකාශිත ලේඛන උරුමය ඒකරාශී කර ජාතික සංචිතයක් ගොඩනැගීම, සංරක්ෂණය කිරීම, නිත්‍යානුකූල තැන්පතු පිටපත් ලබා ගැනීම, ශ්‍රී ලංකාවට අදාළ විදේශීය ප්‍රකාශන ලබා ගැනීම හා ජාතික ග්‍රන්ථ විඥාපන සේවාවන් පවත්වාගෙන යාම දැක්විය හැකිය.

තවද පුස්තකාල විද්‍යා අභ්‍යාස පාඨමාලා පවත්වාගෙන යාම, ජාතික පුස්තකාලයේ කාර්යය මණ්ඩලය හා අවශ්‍යතාව අනුව වෙනත් පුස්තකාලවල කාර්ය මණ්ඩල පුහුණු කිරීම, පුස්තකාල විද්‍යා වෘත්තීය පුහුණු පහසුකම් සැලසීම දැක්විය හැකිය. ඒ අනුව මෙම කාර්යයන් අතුරින් වර්තමානය වනවිට ප්‍රධාන කාර්යයක් වනුයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම මෙන්ම පුස්තකාල ක්ෂේත්‍රයේ මානව සම්පත් පුහුණු කිරීම, ඔවුන්ගේ දැනුම, ආකල්ප, චර්යාවන්, කුසලතාවන්, හැකියාවන් දියුණු කිරීම හා දැනුවත් කිරීමට දායක වීමයි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ කාර්යය අතුරින් පුහුණු කිරීම, අධ්‍යාපනයක් ලබා දීමේ කාර්යය ඉතා වැදගත් ස්ථානයක් ගනී. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් මෙහෙයවනු ලබන පුස්තකාල පාඨමාලා ක්ෂේත්‍ර දෙකක් යටතේ සාකච්ඡා කළ හැකිය. එනම් සේවාස්ථ පාඨමාලා හා පුස්තකාල විද්‍යා ප්‍රලේඛන සහ ප්‍රවෘත්ති විද්‍යා තැපැල් මාර්ගික පාඨමාලාවන්ය. පුස්තකාල ක්ෂේත්‍රයේ නිරතව සිටින මානව සම්පත් යාවත්කාලීන කිරීම මෙම පාඨමාලාවන්හි අරමුණ වේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය 1983/84 අධ්‍යයන වර්ෂය සඳහා පුස්තකාල විද්‍යා ප්‍රලේඛන සහ ප්‍රවෘත්ති විද්‍යා තැපැල් මාර්ගික පාඨමාලාව ආරම්භ කර ඇත. 1983/84 හා 1985/86 අධ්‍යයන වර්ෂවල මෙම පාඨමාලා සාර්ථකව පවත්වා ඇති අතර 1986/87 අධ්‍යයන වර්ෂය අවසානයේ දී මෙම පාඨමාලාව විවිධ හේතූන් මත නවතා දැමීමට සිදු වී ඇති බව පෙනේ.

පුස්තකාල විද්‍යා ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණ මාලාවක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් 1985 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර ගුරු පුස්තකාලයාධිපතිවරු සඳහා පාඨමාලා 20 ක් පවත්වා ඇත. එමෙන්ම මහජන පුස්තකාලයාධිපතිවරුන් සඳහා 1982 සිට 1986 වර්ෂය දක්වා පාඨමාලා 28 ක් පවත්වා ඇති බව සඳහන්ය. පාසල් පුස්තකාල, මහජන පුස්තකාල, පිරිවෙන් පුස්තකාල, පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා පොත් බැඳීම පිළිබඳව මෙම පාඨමාලාවන් සකස් වී ඇත.(ආනන්ද තිස්ස, 2014, පි. 152).

වර්තමානයේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් පූර්ණකාලීන පාඨමාලා පැවැත්වීම වෙනුවට සේවස්ථ පුහුණු (දින 05), එක් දින සම්මන්ත්‍රණ, දෙදින සම්මන්ත්‍රණ, එක්දින වැඩමුළු, දෙදින වැඩමුළු හෝ දේශන වශයෙන් පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ වැඩසටහන් සංවිධානය කරනු ලබයි. අරවින්ද (2012, පි.45) අධ්‍යාපන හා පුහුණු අංශය යනුවෙන් වෙනම අංශයක් ද පිහිටුවා ඇති අතර පාඨක සේවා අංශය, පුස්තකාල පර්යේෂණ අංශය, ග්‍රන්ථ විඥාපන පාලන අංශය, ප්‍රතිග්‍රහණ අංශය, පුස්තකාල තාක්ෂණ අංශය, සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය හාපුස්තකාල සහයෝගිතා අංශය මගින් ද විවිධ පුහුණු පාඨමාලාවන් පවත්වනු ලබයි.

අද වන විට ශ්‍රී ලංකාවේ පුස්තකාලයාධිපති වෘත්තියට සුවිශේෂී ස්ථානයක් හිමි වී ඇති බව පෙනේ. වර්තමානයේ දේශීය, විදේශීය, රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා ආයතනවල පුස්තකාලවල රැකියා අවස්ථා බහුලව දැකිය හැකිය. මේ අනුව ලංකාව තුළ පුස්තකාලයාධිපති වෘත්තියට රැකියා වෙළෙඳපලක් ගොඩනැගෙන බව පෙනේ.

අතීතයේ පැවති සාම්ප්‍රදායික පුස්තකාල වර්තමානය වන විට අතථ්‍ය පුස්තකාලවලට පරිවර්තනය වීමත් සමඟ පුස්තකාලයේ කටයුතු මෙන්ම

පුස්තකාලයාධිපතීන්ගේ කාර්යභාරය ද පුළුල් වී ඇත. මෙම වාතාවරණයත් සමඟ පුස්තකාලවල පවත්වනු ලබන පුහුණු වැඩසටහන් ද වෙනස් වී ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුවත්, විශේෂයෙන් අන්තර්ජාලය බිහි වීමත් සමඟ වර්තමානයේ පුස්තකාල ක්ෂේත්‍රය ද පරිවර්තනයට බඳුන් වෙමින් පවතී. පුස්තකාල ඩිජිටල්කරණය, ස්වංක්‍රීයකරණය, දත්ත පදනම්, ඉලෙක්ට්‍රොනික ග්‍රන්ථ, ඉලෙක්ට්‍රොනික සඟරා, පුස්තකාල සහයෝගිතාව, පුස්තකාල සේවා අලෙවිකරණය වැනි නව සේවාවන්, කාර්යයන් වෙත අනුගත වීමට පුස්තකාලයාධිපතිවරුන්ට සිදු විය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය නිරතුරුව ශීඝ්‍රයෙන් නව්‍යකරණය වන තාක්ෂණය හමුවේ විවිධ අභියෝග වලට මුහුණ දෙනු ලබයි. ඉතා සීමිත අයවැයක් යටතේ ක්‍රියාත්මක වන ජාතික පුස්තකාලයේ ප්‍රධානතම අභියෝගය වන්නේ නවතම තොරතුරු හා විවිධ වූ සේවාවන් පාඨකයාට ලබා දීමයි. උදාහරණයක් ලෙස මාර්ගගත විමර්ශන හා උපදෙස්, E-book පහසුකම් සහ ස්වයංක්‍රීය ස්වයං සේවා ආදී ක්‍රමවේද වේ. මේ නිසා කාර්ය මණ්ඩල පුහුණු කිරීම හා සංවර්ධනය කිරීමේ වැඩසටහන් නිසිලෙස සිදු කළ යුතුය. පුස්තකාල කාර්ය මණ්ඩලය සෑම විටම නව තාක්ෂණය පිළිබඳ දැනුවත් වී සිටීම සහ එම තාක්ෂණය භාවිත කිරීම ඉහත සඳහන් පාඨක අවශ්‍යතාව ඉෂ්ට කිරීමට හේතු වේ.තොරතුරු වෘත්තිකයින්ගේ ඉතා වටිනා මානව සම්පත් දායකත්වය මගින් කාර්ය මණ්ඩල පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වේ. එම වැඩසටහන් මගින් ඇතිව තිබෙන යහපත් ප්‍රතිඵල විමර්ශනයට බඳුන් කොට එම පුහුණු සහ සංවර්ධන වැඩසටහන් එම අදාළ පුස්තකාලයට ප්‍රයෝජනවත් වී දැයි සොයා බැලිය යුතුය.

මේ අනුව ජාතික පුස්තකාලයේ පවත්වනු ලබන පුහුණු වැඩසටහන් මෙතෙක් ඇගයීමකට භාජනය වී නොමැත. ගැටලුව වන්නේ කාලය හා මුදල් ද සේවක ශ්‍රමයද විශාල වශයෙන් වැය කරමින් සිදුකරනු ලබන පුහුණු වැඩසටහන් ක්‍රමවත්ව සිදු කර ඇති ද යන්න මෙතෙක් ඇගයීමක් සිදු කර නොමැති වීමයි. වර්තමානයේ අවශ්‍යතාවලට සරිලන පරිදි පුස්තකාල අධ්‍යාපන ක්‍රමවේදයක් සකස් කළ යුතු අතර පුහුණු අවශ්‍යතා හඳුනාගෙන දැනුම, කුසලතාහා ආකල්ප සම්බන්ධයෙන් පවතින ගැටලු, පරතරය, විෂමතා අවම කරමින් පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමෙන් ඔවුන්ගේ චර්යාවේ වෙනසක් ඇති කළ හැකිය.

## අධ්‍යයනයේ අරමුණු

- අන්තර්ගතය අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම.
- ඉලක්ක කණ්ඩායම් අනුව පුහුණු වැඩසටහන් විග්‍රහ කිරීම.

- පවත්වනු ලබන කාල සීමාව අනුව පුහුණු වැඩසටහන් විමසුමකට ලක් කිරීම.
- භාෂා මාධ්‍ය අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම.
- භූගෝලීය පිහිටීම අනුව පුහුණු වැඩසටහන් විග්‍රහ කිරීම.
- පුහුණු ක්‍රමවේදය අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම.
- ජාතික පුස්තකාලයේ ඇති අංශ අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා යොදාගෙන ඇති පර්යේෂණ ක්‍රමවේදය වන්නේ සිද්ධි අධ්‍යයනයයි. සිද්ධි අධ්‍යයනයේ දී කිසියම් ක්ෂේත්‍රයක/ ආයතනයක සිදුවීමක් ආශ්‍රිතව ගැඹුරින් සියුම්ව විමර්ශනය කිරීම, තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය කර නිගමනවලට එළඹීම සිදුවේ. මෙබඳු සුලු සිද්ධීන් පිළිබඳව ගැඹුරින් විග්‍රහ කිරීමට සෙසු පර්යේෂණ ක්‍රමවලින් අවස්ථාවක් නොලැබුණ ද, එබඳු සිද්ධියක් තුළ ආයතනයක පරිහානියට හෝ උන්නතියට තුඩු දෙන ඇතැම් කරුණු සැඟවී තිබිය හැකිය. එම නිසා සාමාන්‍ය ක්ෂේත්‍ර ගවේෂණයක හෝ පර්යේෂණයකින් ඉදිරිපත් කෙරෙන දළ ව්‍යුහය පරිපූර්ණ වන්නේ මෙබඳු සිද්ධි අධ්‍යයනයන් මගිනි. මේ සඳහා පර්යේෂකයාට අදාළ ආයතනයේ, කිසියම් සුවිශේෂී විමර්ශනයක් අවශ්‍ය වන සිද්ධියක් අළලා මෙබඳු ගැඹුරු විමසුමකට එළඹිය හැකිය. ඇතැම් ආයතනවලට පොදු වූ මෙන්ම එයටම සුවිශේෂී වූ ලක්ෂණ තිබිය හැකිය. සිද්ධි අධ්‍යයන පර්යේෂණකරුවා මෙම සුවිශේෂී ලක්ෂණ ඉලක්ක කොට සිය අධ්‍යයනය කරන අතර එම ලක්ෂණ අදාළ ආයතනයේ කටයුතු කෙරෙහි ද බලපාන ආකාරය විග්‍රහ කරයි. (පලිහක්කාර, 1998).

ඒ අනුව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් 2017 වර්ෂය තුළ පැවැත්වූ පුහුණු වැඩසටහන් 111 ක් පාදක කොට ගෙන මෙම පර්යේෂණය සිදු කර ඇත. පර්යේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්තයන් යොදා ගෙන ඇත. පර්යේෂණ ක්‍රියාවලියේදී ද අධ්‍යයනයට අදාළව තොරතුරු ලබා ගැනීම සඳහා ගැටලුව පිළිබඳ දැනුමක් සහිත පුද්ගලයන් සමඟ සාකච්ඡා කිරීම ඉතා වැදගත් වේ. මෙහිදී යොදා ගෙන ඇත්තේ ආකෘතිකගත සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි. කලින් සූදානම් කරගත් සැලැස්මකට අනුව සම්මුඛ සාකච්ඡාව අසා ඇත. මෙහිදී අසනු ලබන ප්‍රශ්න මුලින්ම තීරණය කර එම පුහුණු වැඩසටහන් පැවැත්වූ අංශවල අංශ ප්‍රධානීන්ගෙන් හා සහභාගී වූ නිලධාරීන්ගෙන් අසා තොරතුරු සටහන් කර ගන්නා ලදී.

## දත්ත විශ්ලේෂණය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ සිදුකරන ලද අධ්‍යයනය තුළින් රැස්කර ගත් දත්ත විශ්ලේෂණය කිරීම හා අර්ථ කථනය කිරීම මෙම පරිච්ඡේදයෙන් සිදු කරන ලදී. මෙම දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රතිශත වගු හා ප්‍රස්ථාර යොදා ගෙන සිදු කර ඇත. පහත අරමුණු අනුව මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය සිදු කොට ඇත.

1 අන්තර්ගතය අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම
2 ඉලක්ක කණ්ඩායම් අනුව පුහුණු වැඩසටහන් විග්‍රහ කිරීම
3 පවත්වනු ලබන කාල සීමාව අනුව පුහුණු වැඩසහන් විමසුමකට ලක් කිරිම
4 භාෂා මාධ්‍යය අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම
5 භූගෝලීය පිහිටීම අනුව පුහුණු වැඩසටහන් විග්‍රහ කිරීම
6 පුහුණු ක්‍රමවේදය අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම
7 ජාතික පුස්තකාලයේ ඇති අංශ  අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම

## අන්තර්ගතය අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරිම

පවත්වා ඇති පුහුණු වැඩසටහන් 111 න් 31 ක් ම පවත්වා ඇත්තේ කියවීම හා රසවින්දනය පිළිබඳවය. එය ප්‍රතිශතයක් ලෙස 27.93% ක් වේ. මෙය පවත්වා ඇත්තේ පාසැල් හා මහජන පුස්තකාල පාඨකයන් සඳහාය. පාඨක අධ්‍යාපනය ද පාඨකයන් සඳහා පවත්වා ඇති අතර අනෙකුත් සියලුම පුහුණු වැඩසටහන් පවත්වා ඇත්තේ පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහාය. දෙවනුව අන්තර්ගතය අනුව වැඩිම පුහුණු වැඩසටහන් ගණනක් පවත්වා ඇත්තේ පුස්තකාල කළමනාකරණය පිළිබඳව වන අතර එය ප්‍රතිශතයක් ලෙස 25.23% ක් වේ.

වගු අංක 1 :  අන්තර්ගතය අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය


| **විෂය** | **පුහුණු වැඩසටහන්** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| කියවීම හා රසවින්දනය | 31 | 27.93 |
| පුස්තකාල කළමනාකරණය | 28 | 25.23 |
| පුස්තකාල සම්පත් හා සේවා | 25 | 22.52 |
| පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය | 10 | 9.00 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 07 | 6.30 |
| පාඨක අධ්‍යාපනය | 04 | 3.60 |

| | | |
|---|---|---|
| පර්යේෂණ ක්‍රමවේදය | 03 | 2.72 |
| වර්ගීකරණය | 01 | 0.90 |
| කාර්යාලයීය කටයුතු | 01 | 0.90 |
| ග්‍රන්ථකරණ හා ප්‍රකාශන ප්‍රමිතිය | 01 | 0.90 |
| සූචිකරණය | 0 | 0.00 |
| **එකතුව** | **111** | **100** |

## ඉලක්ක කණ්ඩායම් අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම

ප්‍රස්තාර අංක 1 අනුව පවත්වා ඇති පුහුණු වැඩසටහන් 111 න් වැඩසටහන් 38 ක් ම පවත්වා ඇත්තේ පාසල් පුස්තකාලයේ සිසුන් හා කාර්ය මණ්ඩල ඉලක්ක කොට ගෙනය. එය ප්‍රතිශතයක් ලෙස 34.25% ක් වේ. මහජන පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා වැඩසටහන් 30 ක් පවත්වා ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස ගත්කළ 27.02% කි.

විශේෂ පුස්තකාල, පිරිවෙන් පුස්තකාල, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය හා ජාතික පුස්තකාලයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් පුහුණු වැඩසටහන් 4 බැගින් පවත්වා ඇත. එම පුහුණු වැඩසටහන් 111 න් 11 ක් වෙනත් ආයතන සඳහා පවත්වා ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 9.90% ක් වේ.




ප්‍රස්තාර අංක 1: ඉලක්ක කණ්ඩායම් අනුව පුහුණු වැඩසටහන් ගණන ප්‍රතිශතයක් ලෙස.

මෙහිදී වෙනත් ආයතන ලෙස සඳහන් කර ඇත්තේ බන්ධනාගාර පුස්තකාල, විශේෂ කාර්ය බලකා, උසාවි, ලේඛනාගාර, ටවර්හෝල් පදනම, දුම්රිය

දෙපාර්තමේන්තු පුස්තකාල වේ. ගුරු විදුහල් හා විද්‍යා පීඨ පුස්තකාල කාර්ය මණ්ඩලය වෙනුවෙන් පුහුණු වැඩසටහන් 2 ක් ද විශ්වවිද්‍යාල සඳහා පුහුණු වැඩසටහන් 01 බැගින් මෙහෙයවා ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 0.90 ක් වේ.

## පවත්වනු ලබන කාල සීමාව අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම

පවත්වා ඇති වැඩසටහන් 111 න් පුහුණු වැඩසටහන් 75 ක් එක් දින වැඩසටහන් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 67.56% කි. පවත්වනු ලැබ ඇති කාල සීමාව අනුව දෙවනුව වැඩිම වැඩසටහන් ගණනක් පවත්වා ඇත්තේ දෙදින වැඩසටහන්ය. එය ප්‍රතිශතයක් ලෙස 27.04% කි. පස්දින වැඩසටහන් 05 ක් මෙහෙයවා ඇති අතර එය තුන්වන ස්ථානයට පැමිණ තිබේ. එය ප්‍රතිශතාත්මකව දැක්වූවහොත් 4.50% ක් වේ. දෙදින පුහුණු වැඩසටහන් පවත්වා ඇත්තේ 1 ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 0.90% කි.

වගු අංක 2 : පවත්වනු ලබන කාල සීමාව අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය

| කාලය | පැවැත්වූ වැඩසටහන් ගණන | ප්‍රතිශතය (%) |
|---|---|---|
| එක් දින වැඩමුළු | 75 | 67.56 |
| දෙදින වැඩමුළු | 30 | 27.04 |
| පස්දින වැඩමුළු | 05 | 4.50 |
| තෙදින වැඩමුළු | 01 | 0.90 |
| **එකතුව** | **111** | **100** |

## භාෂා මාධ්‍ය අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම

භාෂා මාධ්‍යය අනුව පුහුණු වැඩසටහන් පවත්වා ඇති ආකාරය විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ වැඩසටහන් 111 කින් 103 ක්ම සිංහල භාෂාවෙන් පවත්වා ඇති බවයි. එය ප්‍රතිශතයක් ලෙස 92.80% කි. සිංහල හා දෙමළ භාෂාව ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවන් වන තත්ත්වයක් තුළ දෙමළ භාෂාවෙන් පවත්වා ඇති පුහුණු වැඩසටහන් ගණන 07 ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 6.30% කි. ඉංග්‍රීසි භාෂාවෙන් කිසිදු වැඩසටහනක් පවත්වා නොමැති අතර සිංහල සහ දෙමළ භාෂා ඒකාබද්ධ කොට එක වැඩසටහනක් ලෙස පවත්වා ඇත. එය ප්‍රතිශතයක් ලෙස 0.90% ක් වේ.

වගු අංක 3: භාෂා මාධ්‍ය අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය

| **භාෂාව** | **වැඩසටහන් ගණන** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| සිංහල | 103 | 92.80 |
| දෙමළ | 07 | 6.30 |
| සිංහල හා දෙමළ | 01 | 0.90 |
| ඉංග්‍රීසි | 00 | 0.00 |
| **එකතුව** | **111** | **100** |

## භූගෝලීය පිහිටීම අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම


භූගෝලීය පිහිටීම අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීමේ දී පවත්වා ඇති වැඩසටහන් 111 න් 57 ක්ම පවත්වා ඇත්තේ බස්නාහිර පළාතේය. එය ප්‍රතිශතයක් ලෙස 51.34% කි. දෙවන ස්ථානය හිමි කර ගෙන ඇත්තේ දකුණු පළාතය. දකුණු පළාතේ පුහුණු වැඩසටහන් 16 ක් පවත්වා ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 14.46 ක් වේ. උතුරු මැද පළාත හා සබරගමුව පළාත පුහුණු වැසටහන් 07 ක් ද එහි ප්‍රතිශතය 6.30% ක් ලෙස පවත්වා ඇත. ඌව පළාත තුළ පුහුණු වැඩසටහන් 06 ක් පවත්වා ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 5.40% කි. වයඹ පළාත වැඩසටහන් 05 ක් පවත්වා ඇති අතර එහි ප්‍රතිශතය 4.5% කි. අවම වැඩසටහන් සංඛ්‍යාවක් පවත්වා ඇත්තේ උතුරු පළාතේය. මෙහිදී වැඩසටහන් 02 ක් පවත්වා ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 1.80% කි.

වගු අංක 4: භූගෝලීය පිහිටීම අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය

| **පළාත** | **පුහුණු වැඩසටහන් ගණන** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| බස්නාහිර පළාත | 57 | 51.34% |
| දකුණු පළාත | 16 | 14.46% |
| මධ්‍යම පළාත | 08 | 7.20% |
| උතුරු මැද පළාත | 07 | 6.30% |
| සබරගමුව පළාත | 07 | 6.30% |
| ඌව පළාත | 06 | 5.40% |
| වයඹ පළාත | 05 | 4.50% |
| නැගෙනහිර පළාත | 03 | 2.70% |
| උතුරු පළාත | 02 | 1.80% |
| **එකතුව** | 111 | 100% |

## පුහුණු ක්‍රමවේදය අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම

ප්‍රස්තාර අංක 2 අනුව වැඩසටහන් 111 න් වැඩසටහන් 56 ක් ම මෙහෙයවා ඇත්තේ සම්මන්ත්‍රණ ආකාරයටය. එය ප්‍රතිශතයක් ලෙස 50.45%කි. පවත්වා ඇති පුහුණු ක්‍රමවේදය අනුව වැඩමුළු 38 ක් පවත්වා එය දෙවන ස්ථානයට පැමිණ ඇති අතර එය ප්‍රතිශතාත්මකව 34.25% ක් වේ. දේශන ආකාරයට පවත්වා ඇති පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 09 කි. එය ප්‍රතිශතාත්මක ලෙස දැක්වූවහොත් 8.10% වේ.




ප්‍රස්තාර අංක 2: පුහුණු ක්‍රමවේදය අනුව පුහුණු වැඩසටහන් ගණන ප්‍රතිශතයක් ලෙස

සේවස්ථ පුහුණුව ලෙස පවත්වා ඇති වැඩසටහන් සංඛ්‍යාව 05 කි. එය 4.50% ක ප්‍රතිශතයක් වේ. සහතික පත්‍ර පාඨමාලා ලෙස පවත්වා ඇත්තේ පුහුණු වැඩසටහන් 03 ක් පමණි. එය ප්‍රතිශතයක් ලෙස 2.70% කි.

## ජාතික පුස්තකාලයේ ඇති අංශ අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීම

ජාතික පුස්තකාලයේ ඇති අංශ අනුව දත්ත විශ්ලේෂණයේ දී ගම්‍ය වන්නේ පුහුණු වැඩසටහන් වැඩි ප්‍රමාණයක් පවත්වා අධ්‍යාපන හා පුහුණු අංශ මගින් බවයි.

වගු අංක 5: ජාතික පුස්තකාලයේ ඇති අංශ අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය

| **අංශය** | **පුහුණු වැඩසටහන් ගණන** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| පුස්තකාල අධ්‍යාපන හා පුහුණු අංශය | 60 | 54.06% |
| පාඨක සේවා අංශය | 22 | 19.84% |

| | | |
|---|---|---|
| පුස්තකාල සංරක්ෂණ අංශය | 10 | 9.00% |
| ව්‍යාප්ති සේවා අංශය | 09 | 8.10% |
| පුස්තකාල පර්යේෂණ අංශය | 03 | 2.70% |
| ග්‍රන්ථ විඥාපන පාලන අංශය | 02 | 1.80% |
| තොරතුරු තාක්ෂණ අංශය | 02 | 1.80% |
| ප්‍රතිග්‍රහණ අංශය | 02 | 1.80% |
| ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය | 01 | 0.90% |
| **එකතුව** | 111 | 100% |

පවත්වා ඇති මෙම පුහුණු වැඩසටහන් 111 න් 60 ක් ම පවත්වා ඇත්තේ අධ්‍යාපන හා පුහුණු අංශය මගිනි. එය ප්‍රතිශතයක් ලෙස 54.06% ක් වේ. පාඨක සේවා අංශය හා පුස්තකාල සංරක්ෂණ අංශය පවත්වන ලද අංශ අනුව පිළිවෙලින් දෙවන හා තුන්වන ස්ථානයන් හිමි කර ගනියි. පාඨක සේවා අංශය විසින් පුහුණු වැඩසටහන් 22 ක් මෙහෙයවා ඇති අතර එය ප්‍රතිශතාත්මක ලෙස ගත් කළ 19.84% කි. පුස්තකාල සංරක්ෂණය අංශය විසින් පුහුණු වැඩසටහන් 10 ක් පවත්වා ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 9% අගයක් ගනී. පෙන්වා ඇති වැඩසටහන් 111 න් වැඩසටහන් 09 ක් පවත්වා ඇත්තේ ව්‍යාප්ති සේවා අංශය මගිනි. අවම වැඩසටහන් සංඛ්‍යාවක් පවත්වා ඇත්තේ ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය මගිනි. එහිදී පවත්වා ඇති වැඩසටහන් ගණන 01 ක් වන අතර එය ප්‍රතිශතාත්මක ලෙස ගත් කළ 0.90%ක් වේ.

## සම්මුඛ සාකච්ඡා

සමස්තයක් වශයෙන් ජාතික පුස්තකාලයේ පුහුණු වැඩසටහන් සකස් විය යුතු ආකාරය මෙන්ම ගැටලු පිළිබඳ අංශ ප්‍රධානින් හා නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි. මේ සඳහා කරුණු කිහිපයක් ඔවුන් හමුවේ ඉදිරිපත් කළ අතර ඒ සඳහා ඔවුන් දුන් ප්‍රතිචාර ඇගයීමකට භාජනය කරන ලදී. මෙහිදී සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ දස දෙනාම ප්‍රකාශ කර සිටියේ පුස්තකාල පුහුණු වැඩසටහන් වැඩි දියුණු කිරීම හා ඒවා විධිමත් ආකාරයට පැවැත්වීම ඉතා වැදගත් බවය. මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ විමසීමේ දී ද මෙම දස දෙනා ප්රකාශ කර සිටියේ එක සමාන අදහසකි. පුහුණු වැඩසටහන් කිරීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන අඩු වීම ගැටළුක් ලෙස පෙන්වා දෙන ලදී. මෙහිදී දෙදෙනෙකුගේ අදහස වූයේ පළාත් පාලන ආයතනවලින් මහජන පුස්තකාල හා පාසැල් පුස්තකාල සඳහා එම ආයතනවලින් පුහුණු වැඩසටහන්වලට ප්‍රතිපාදන වෙන් කර නොමැති බවත් සියලුම මුදල් ජාතික පුස්තකාලයට දැරීමට සිදුවන බවත් ය. අධ්‍යාපන හා පුහුණු අංශයට උපරිමව

ලබාදෙන්නේ ලක්ෂ දොළහක් පහළොවක් අතර බවත් ඉන් ලක්ෂ හයක් හෝ හතක් අතර ප්‍රමාණයක් මණ්ඩලීය නිලධාරීන් පුහුණු කිරීමට වැය වන බවත් ය. තව ද ඉතිරි මුදල් රටේ ඇති සියලුම පුස්තකාල ආවරණය කිරීමට අපොහොසත් වන බවත් ය.

තව ද ප්‍රධාන පුහුණු සැලැස්මක් නොමැති වීම ගැටළුවක් බව තිදෙනෙකුගේ අදහස විය. ඒ ඒ අංශවලට වෙන් වෙන් වශයෙන් සැලැස්මක් තිබුණද, පොදු සැලැස්ම සෑදීමේ දී ඒ ඒ අංශවල සම්බන්ධීකරණය නොමැති වීම නිසා පුහුණු වැඩසටහන්වලදී එකම විෂය කරුණු පිළිබඳ අංශ කිහිපයකින් සිදුවන බව පෙන්වා දී ඇත. එමෙන්ම සාකච්ඡාවට බඳුන් කළ සියලු දෙනාම පවසා සිටියේ විෂය මාලාව සංශෝධනය කළ යුතු බවය. තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමඟ පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය මාලා සංශෝධනය කිරීම කාලීන අවශ්‍යතාවයක් බව පෙන්වා දෙන ලදී. මෙහිදී දෙදෙනෙකුගේ අදහස වූයේ අනාගත පුස්තකාල වෘත්තියට සාම්ප්‍රදායික විෂයයන් පිළිබඳ දැනුමැති පිරිසක් මෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ මනා දැනුමක් ඇති පිරිසක් අත්‍යවශ්‍ය බවය. පුස්තකාල හා විඥාපන විද්‍යා විෂයානුබද්ධ මූලික විෂයයන් නිවැරදිව හඳුනා ගැනීම මෙන්ම අන්තර්ජාල භාවිතය පිළිබඳ පරිචයක් ඇති පුස්තකාල වෘත්තිකයන් බිහිකිරීමට සුදුසු ආකාරයට පුස්තකාල හා විඥාපන විෂය මාලා වර්තමානයට ගැලපෙන පරිදි යාවත්කාලීන කළ යුතු බව සඳහන් කරන ලදි. පුස්තකාල වෘත්තිකයන් නව දැනුමෙන් සන්නද්ධ කිරීම සඳහා උපදේශනාත්මක පුහුණු වැඩසටහන් පැවැත්විය යුතු බව තවදුරටත් අවධාරණය කරන ලදී.

සම්මුඛ සාකච්ඡාවට බඳුන් වූ සිව් දෙනෙකුගේ අදහස වූයේ පුස්තකාල විද්‍යාවට අමතරව තොරතුරු කළමනාකරණය, අලෙවිකරණය, ප්‍රකාශන ක්ෂේත්‍රය, ව්‍යාපෘති කළමනාකරණය වැනි විෂයයන් විෂය මාලාව තුළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම වැදගත් බවයි. විශේෂයෙන් පරිගණක විද්‍යාව මෑත කාලයේ අතිශයින් ජනප්‍රිය වූත් විශාල වශයෙන් පුළුල් වූත් සංකීර්ණ වූත් විෂය ක්ෂේත්‍රයකි. පාඨක සේවා සැපයීමේ දී මෙන්ම පුස්තකාල විද්‍යා විෂය හා සම්බන්ධ ප්‍රධාන විෂය ක්ෂේත්‍රය වන්නේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයයි. ජාල නිර්මාණකරණය, දත්ත පදනම් නිර්මාණය, පද්ධති විශ්ලේෂණය, වැඩසටහන් නිර්මාණය කිරීම, විවෘත හා වාණිජ පුස්තකාල මෘදුකාංග හා අන්තර්ජාල මූලාශ්‍ර, සේවා පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතු බව පෙන්වා දී ඇත. තවද පුස්තකාලය තුළ කරන කාර්යයන් පිළිබඳ ලබාදෙන පුහුණුව මෙන්ම පාඨකයා හා සම්බන්ධ වීමේ දී ඇතිවන ප්‍රායෝගික ගැටලු විසඳා ගැනීම සම්බන්ධ දැනුම පුහුණු වැඩසටහන් තුළින් ලබා දිය යුතු බව අවධාරණය කර ඇත. එමෙන්ම සූචිකරණය හා වර්ගීකරණය සඳහා ප්‍රායෝගික පුහුණු වැඩි කළ යුතු බවත් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමට වැඩි අවධානයක් යොමු කළ යුතු බව තිදෙනෙකුගේ අදහස විය.

ප්‍රායෝගිකව පුහුණු වැඩසටහන් පැවැත්වීමේ දී අවශ්‍ය භෞතික පරිසරය දේශන ශාලා හා උපකරණ පිළිබඳ යම් ගැටලු ඇති බව සියළු දෙනාගේම අදහස විය. පුහුණු වැඩසටහන් පැවැත්වීම සීමාසහිත වීමට හේතු ලෙස තිදෙනෙකුගේ අදහස වූයේ වැඩසටහනක් පැවැත්වීමට ගත වන කාලය දීර්ඝ වීමයි.

උදාහරණයක් ලෙස ලිඛිතව ලිපි යැවීම, ඒවා සංවිධානය කර ගැනීමට අවම වශයෙන් මාස දෙකක වැනි කාලයක් ගතවෙයි තවද පුහුණුව ලබා දුන්නද පුහුණුකරුවාට අදාළ පුස්තකාලවල එම පහසුකම් නොමැති වීම ප්‍රශ්නයකි. තවද මෙම පුහුණු වැඩසටහන් පැවැත්විමෙන් පසු එම වැඩසටහන කොතෙක් දුරට සාර්ථක හෝ අසාර්ථක වූවාද යන්න පිළිබඳ පසු විපරමක් හෝ ඇගයීමක් කිරීමට ක්‍රමවේදයක් නොමැති කම ගැටළුවක් බව තිදෙනෙකුගේ අදහස විය. තව ද පුස්තකාල පුහුණු වැඩසටහන් පැවැත්වීමේ දී අභ්‍යන්තරයේ පවතින ප්‍රශ්නාදිය නිරාකරණය කිරීම තුළින් පවතින බොහොමයක් ගැටලු සහ අභියෝග සඳහා විසඳුම් සැපයීමට හැකි බව සියළු දෙනාගේම අදහස විය.

## නිගමන

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුවත් සමඟ පුස්තකාලයේ කටයුතු මෙන්ම පුස්තකාලයාධිපතීන්ගේ කාර්යභාරය ද පුළුල් වී ඇත. ලෝකයේ අනෙකුත් රටවල ඔවුන්ගේ පුහුණු වැඩසටහන්වලදී නවීන තාක්ෂණයත් සමඟ පුස්තකාලයේ සිදුවන වෙනස්කම් කෙරෙහි අවධානය යොමු කර තිබේ. උදාහරණ ලෙස පර්යේෂණ ක්‍රමවේදය,තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, කාර්යාලයීය කටයුතු, සූචිකරණ හා වර්ගිකරණය පිළිබඳ වැඩසටහන්වලට වැඩි අවධානයක් යොමු කර ඇත. නමුත් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ඒ සඳහා යොමු කර ඇති අවධානය අවම වේ. උදාහරණයක් ලෙස RDA සූචිකරණ වැඩසටහන් දැක්විය හැකිය. RDA 1997 වසරේ දී ලොවට හඳුන්වා දුන් අතර 2008 වසරේ දී පමණ ඕස්ට්‍රේලියා ජාතික පුස්තකාල කාර්ය මණ්ඩල පුහුණු කිරීමට ආරම්භ කර ඇත. නමුත් මේ දක්වා ජාතික පුස්තකාලයේ RDA සංකල්පය පිළිබඳ අවධානය යොමු වී නැත. සම්මුඛ සාකච්ඡාවලදී මෙම RDA සම්බන්ධ වැඩසටහන් කෙරෙහි සැලකිල්ල යොමු විය යුතු බව පෙන්වා දී ඇති නමුත් ගැටලුව වී ඇත්තේ ඒ සඳහා සම්පත්දායකයින් හිඟ වීමයි. සූචි කාඩ්පත් ලිවිම, සාම්ප්‍රදායික යල් පැනගිය කාර්යයකි. අභාවයට යමින් පවතින ඉහත කාර්යයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය නොවේ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ජාතික කියවීමේ මාසයට සමගාමීව විවිධ වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. මෙම වැඩසටහන්හි අරමුණ වනුයේ පොදු පාඨක ප්‍රජාව අතර කියවීම ප්‍රචලිත කිරීම, රසවින්දනය හා පරිකල්පනය උසස් මට්ටමකට ගෙන ඒමයි. මෙම කියවීම් හා රසවින්දන

වැඩසටහන් පාඨක සේවා අංශය, අධ්‍යාපන හා පුහුණු අංශ, ව්‍යාප්ති සේවා යන අංශ තුනෙන්ම පවත්වා ඇති අතර අධ්‍යාපන හා පුහුණු අංශය විසින් සාහිත්‍ය රසාස්වාදය පිළිබඳ දැනුවත් කිරීම සිදු කර ඇත. ව්‍යාප්ති සේවා අංශය මගින් කියවීම් කඳවුරු පවත්වා ඇති අතර සිතියම් කියවීම, පින්තූර කියවීම, මුද්දර කියවීම, සංකේත කියවීම, විමර්ශන ග්‍රන්ථ හා ග්‍රන්ථ නාමාවලී කියවීම යන අංග මේ සඳහා ඇතුළත් කර ඇත. කියවීම් කඳවුරු පාසල් ශිෂ්‍ය ප්‍රජාව කේන්ද්‍ර කොටගෙන පවත්වා ඇත.

පාඨක සේවා අංශය මගින් ජාතික කියවීමේ මාසයට සමගාමීව පාසල් ළමුන් සඳහා කියවීම සහ රසවින්දනය පිළිබඳ වැඩසටහන් මාසය පුරා පවත්වා ඇත. ඒ අනුව මෙම අංශ තුනෙන්ම එකම විෂය පථයක් ඔස්සේ වැඩසටහන් සංවිධානය කොට ඇත. පුස්තකාල විද්‍යාව යනු පුළුල් පරාසයක විහිදී යන විෂයයකි. නමුත් තෝරාගත් විෂය කරුණු කිහිපයක් යටතේ ජාතික පුස්තකාලයේ විවිධ අංශ මගින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරයි. එම වැඩසටහන් තුළ එකම විෂය කරුණු, නැතිනම් එකම මාතෘකා සාකච්ඡාවට බඳුන් වේ.අධ්‍යාපන හා පුහුණු අංශය, පුස්තකාල කළමනාකරණය හා සේවාස්ථ පුහුණු වැඩසටහන් ද ග්‍රන්ථ විඥාපන පාලන අංශය, පුස්තකාල කටයුතු පිළිබඳවත්, ප්‍රතිග්‍රහණ අංශය මගින් පුස්තකාල තාක්ෂණ කටයුතු පිළිබඳවත් පුහුණු වැඩසටහන් පවත්වා ඇත.මෙම අංශ තුනෙන් ම පොදුවේ පුස්තකාල සඳහා සම්පත් තෝරා ගැනීම, අත්පත් කර ගැනීම, පිරිසැකැස්ම, ප්‍රතිග්‍රහණය, වර්ගීකරණය, සූචිකරණය, ප්‍රලේඛන මූලාශ්‍ර සම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් මහජන, පාසල්, පිරිවෙන්, විද්‍යාපීඨ පුස්තකාලයාධිපතිවරුන් හා කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහනේ මාතෘකාවේ සුළු වෙනසක් පමණක් සිදු කොට එකම රාමුවක් ඔස්සේ පවත්වා ඇත.

පුස්තකාලයාධිපතිවරයෙකුගේ ප්‍රධාන වගකීම වනුයේ පාඨකයා වෙත තොරතුරු කාර්යක්ෂමව හා නිවැරදිව සපයා දීමයි. මේ සඳහා පුස්තකාල එකතුව මැනවින් සංවිධානය කළ යුතු වේ. පුස්තකාල එකතුවක් මනා ලෙස සංවිධානය කිරීමේ ක්‍රමවේද අතර වර්ගීකරණය සහ සූචිකරණ සඳහා සුවිශේෂී ස්ථානයක් හිමි වේ. මෙම විෂය කොටස්හි ප්‍රායෝගික දැනුම පුස්තකාලයාධිපතිවරයෙකුට අතිශයින් වැදගත් වෙයි. එනමුත් මෙම විෂය ක්ෂේත්‍රය අළලා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් 2017 වර්ෂයේ දී එක් පුහුණු වැඩසටහනක් පමණක් සංවිධානය කොට ඇත. මෙම ප්‍රායෝගික වැඩසටහන් සඳහා වැඩි අවධානයක් යොමු කළ වුවත් ඒ පිළිබඳ නිසි අවධානයක් යොමු වී නොමැත.

ඉලක්ක කණ්ඩායම් අනුව පුහුණු වැඩසටහන් විශ්ලේෂණය කිරීමේදී විද්‍යමාන වන කරුණක් වන්නේ සමස්ත පුහුණු වැඩසටහන් තුළින් වැඩිම වැඩසටහන් ගණනක් පවත්වා ඇත්තේ පාසල් පුස්තකාල ඉලක්ක කර ගෙන ඇති බවයි. එයට හේතු වී ඇත්තේ 2017 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශය මගින් බස්නාහිර පළාතේ

පුස්තකාල සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙස ලෙස කර ඇති ඉල්ලීමයි. වැඩසටහන් පවත්වනු ලබන කාලසීමාව අනුව එක් දින පුහුණු වැඩසටහන් සංඛ්‍යාවක් වැඩිවීමත් එයට සාපේක්ෂව දෙදින තෙදින හා සිව්දින වැඩසටහන් පැවැත්වීම අවම අගයක් ගැනීමට හේතුව ලෙස දැක් වූයේ වැඩසටහන් සඳහා පැමිණෙන පුහුණුලාභින්ගෙන් බහුතරයක් රැකියාවේ නිරතවීම හා නේවාසික පහසුකම්, ප්‍රවාහන පහසුකම් හා ආහාර පාන සැපයීමේ දී ඇතිවන දුෂ්කරතා නිසා දීර්ඝ කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීමට අසීරු බවය.

## යෝජනා

පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයට පැමිණි නව විෂය ක්ෂේත්‍ර පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම හා ඒ සම්බන්ධ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව වැඩි කිරීම. උදාහරණ RDA ප්‍රායෝගික පුහුණු වැඩසටහන් සංඛ්‍යාව වැඩි කිරීම. මෙහිදී ඩිවි දශම වර්ගීකරණ ක්‍රමය, සූචිකරණය හා විෂය ශීර්ෂ ආදී ක්ෂේත්‍රයන් පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් වැඩි කිරීමට කටයුතු කළ යුතුය.

නවීන තාක්ෂණයේ දියුණුවත් සමඟ කාර්යක්ෂම හා ඵලදායි පුස්තකාල සේවාවක් ලබාදීම සඳහා පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමට අවශ්‍ය බැවින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වැනි ක්ෂේත්‍රයට අයත් දත්ත පදනම් නිර්මාණය, පද්ධති විශ්ලේෂණය, පරිගණක වැඩසටහන් නිර්මාණය, පරිගණක කාර්යාලයීය ක්‍රමවේද, විවෘත හා වාණිජ මෘදුකාංග,අන්තර්ජාල මූලාශ්‍ර,ඉලෙක්ට්‍රොනික ප්‍රකාශන හා පරිගණක ආරක්ෂණය යන විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්විය යුතුය.  සිංහල මාධ්‍ය පුහුණු වැඩසටහන්වලට සාපේක්ෂව උතුරු හා නැගෙනහිර පළාත්වල පුස්තකාලයාධිපතීන් ඉලක්ක කර ගනිමින් දෙමළ මාධ්‍ය පුහුණු වැඩසටහන් සංවිධානය කළ යුතුය. සිංහල හා දෙමළ මාධ්‍ය සිසුන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පුස්තකාල විද්‍යා පාඨමාලා හැදෑරීමට උනන්දුවක් දක්වන බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කර ඉංග්‍රීසි මාධ්‍යයෙන් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට පියවර ගැනීම.

දිවයිනේ සියලු පළාත් ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම. පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේ දී මහජන සහ පාසල් පුස්තකාල පමණක් නොව අනෙකුත් වර්ගයේ පුස්තකාල ද ඉලක්ක කර ගනිමින් පුහුණු වැඩසටහන් සංවිධානය කළ යුතුය. සාම්ප්‍රදායික පුහුණු ක්‍රමවලින් මිදී නව තාක්ෂණයට අනුව පුහුණු වැඩසටහන් යාවත්කාලීන කළ යුතුය. සාම්ප්‍රදායික දේශන රටාවෙන් බැහැරව ප්‍රායෝගිකව ක්‍රියාකාරකම් සහිතව පුහුණු වැඩසටහන් සංවිධානය කළ යුතුය. මේ සඳහා අවශ්‍ය පුහුණුකරුවන් ඉලක්ක කරගෙන  සමීක්ෂණ කර ඔවුන්ට වඩාත් වැදගත්වන විෂයන් පිළිබඳ අවධානය යොමු කරමින් පුහුණු වැඩසටහන් සංවිධානය කළ යුතුය. යම්කිසි විෂය ක්ෂේත්‍රයක් පිළිබඳව පුහුණු නිලධාරීන් අවම

විෂය ක්ෂේත්‍ර, තෝරාගෙන පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම (Trainer, Trainee) හා ඒ තුළින් පුහුණු සංචිතයක් ගොඩ නැගීම.

තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා හා පුස්තකාල සේවාවන්ගේ තත්ත්වය වැඩි දියුණු වී ඇති අතර එම වෙනස් වූ අවශ්‍යතා හඳුනා ගැනීමට සමීක්ෂණ සිදු කළ යුතුය. එම සමීක්ෂණ වාර්තා අනුව පුහුණු අවශ්‍යතා හඳුනා ගෙන සියලුම වර්ගයේ පුස්තකාල සඳහා පුහුණු වැඩසටහන් සකස් කළ යුතුය.

පුහුණුලාභීන්ට පුහුණුවට සහභාගී වීමට පහසු ආකාරයෙන් ශාලාවේ ආසන පහසුකම් සැලසීම ඉතා වැදගත් වේ. සම්පත් දායකයින් සමඟ පුහුණුලාභියා මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට නම් අභ්‍යන්තර සැලැස්ම හා භෞතික පරිසරය හොඳින් සකස් විය යුතුය. ආසන පහසුකම් සැලසීමේ දී පුහුණු ක්‍රමවේදය අනුව ශාලාවේ අසුන් පහසුකම් තිබිය යුතුවේ. නමුත් ජාතික පුස්තකාලයේ ඇත්තේ ප්‍රධාන ශ්‍රවණාගාරයක් හා කුඩා ශ්‍රවණාගාරයක් පමණි. මේ නිසා මේ පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.

පුහුණු වැඩසටහන් අවසානයේ දී පුහුණුලාභීන් සඳහා ඇගයීම් පත්‍රිකා යොමු කර පිළිතුරු ලබා ගැනීම එතරම් සාර්ථක ක්‍රමයක් නොවේ. ඒ වෙනුවට පුහුණුලාභීන්ගෙන් ප්‍රත්‍යාවේක්ෂණ වාර්තා (reflection) ලබා ගැනීම වැදගත් වන අතර ඒ තුළින් ඉදිරි පුහුණු වැඩසටහන් සංවිධානය කර ගත යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය

අරවින්ද, මිහිර. (2012). ශ්‍රී ලංකා පුස්තකාල අධ්‍යාපනය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දායකත්වය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය, 22 වන සංවත්සරය (1990-2012) සමරු කලාපය, කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

ආනන්ද තිස්ස, ආර්. ඩී. (2014). ශ්‍රී ලංකාවේ පුස්තකාල සංවර්ධන අරභයා පනස් වසරක (1957-2013) පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපන මෙහෙය පිළිබඳ අතීතාවලෝකනයක්, කෘතවේදී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ අභිනන්දන ග්‍රන්ථය

1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා පනත (1970). කොළඹ : ලංකා පාර්ලිමේන්තුව

පලිහක්කාර, හේමමාලි. (1998). අධ්‍යාපන පර්යේෂණකරණයට අත්වැලක්, කොළඹ : ගොඩගේ

Amarasiri, M.S.U. (1990). The National Library of Sri Lanka an Introduction, *National Library of Sri Lanka commemorative volume*, Sri Lanka National Services Board, Colombo.